# සහෝදරයෝ



**H.M. තෙවුනි සදෙස්නා හේරත්**

# සහෝදරයෝ

කර්තෘ : H.M. තෙවුනි සදෙස්නා හේරත්
: 1 ශ්‍රේණිය
: මහ/මහාමායා බාලිකා විද්‍යාලය

කර්තෘ ප්‍රකාශනයකි

දිනය : 2025.02.08

ISBN Number : 978 624 208 635 - 4

# පිදුම

වසරක කාලයක්

මා හට අකුරු කරන්නට

සෙවණ දුන්

ආදරණීය මහාමායා බාලිකා විදුහල්

මැණියන්ට

සෙනෙහසින් පුදන්නෙමි.............

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට මෙවර පාසල් ප්‍රජාවට ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක කාලයක අම්මායි, තාත්තායි,
මල්ලීයි සහ අක්කා කෙනෙකුයි ජීවත් වුණා.



හැබැයි මේ අක්කයි මල්ලියි නිතරම රණ්ඩු කළා.
කියන කිසිම දෙයක් අහන්නේ නෑ.



පාසල් නිවාඩු කාලය ආවා. අක්කා ආච්චිලාගේ ගෙදර ගියා.



මල්ලි ගෙදර තනි වුණා. සෙල්ලම් කරන්නවත් කවුරුත් සිටියේ නෑ.



“අක්කා නැතිව පාළුයි. අපි අක්කා එක්කරගෙන එන්න යමු.” මල්ලී කිව්වා.



ඒ වගේම අක්කාටත් මල්ලී නැතිව පාළු දැණුනා.
එයාටත් මල්ලී නැති අඩුව දැණුනා.



මේ දේ දැනෙන්න ඕන නිසා අක්කාව ටික දවසක් ආච්චිලාගේ ගෙදර නතර කරන්න අම්මලා හිතුවා.



දවස් කිහිපයකින් අම්මා සහ තාත්තා එක්ක මල්ලී අක්කා බලන්න ගියා.



දෙන්නා දකිද්දී දෙන්නාටම හරිම සතුටු හිතුණා "ආය අපි රණ්ඩු කරන්නේ නැහැ." අක්කා කිව්වා.



ඔක්කෝටම හරිම සතුටුයි "සහෝදරයෝ වුණාම සමගියෙන ආදරයෙන් ඉන්න ඕනෑ කියලා තාත්තා කිවුවා.



## පසුවදන.

රටේ අනාගතය සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ත ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකිග එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වාර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියග මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි එම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමටම මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නියග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිස පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසනය.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න

මහලේකම්

# ස්තූතිය

මාව පුංචි කතුවරියක් කළ මහනුවර මහාමායා

බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත්, ප්‍රාථමික අංශයේ

විදුහල්පතිතුමිය හා පංතිභාර ගුරුතුමිය

වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරුමෑණියන්ටත්, අනෙකුත් ගුරු

මෑණිවරුන්ටත් ගුරු පියවරුන්ටත්

ආදරණීය අම්මා, අප්පච්චි, අත්තා හා අත්තම්මාටත්

මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.